ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය
කොළඹ

# පුවත්පත් නිවේදනය

## ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය ඉන්දියා - ශ්‍රී ලංකා සංචාරක සබඳතා ප්‍රවර්ධනය කරමින් “ඉන්දියා - ශ්‍රී ලංකා ටුවරිසම් කනකේට්” නමින් වැඩසටහනක් සංවිධානය කරයි

කොළඹ, ඉන්දීය මහ කොමසාරිස් කාර්යාලය විසින් දෙරට අතර සංචාරක සබඳතා ප්‍රවර්ධනය කරමින් “ඉන්දියා - ශ්‍රී ලංකා ටුවරිසම් කනකේට්: ගංගා නදියේ සිට කැළණි නදිය දක්වා මිත්‍රත්වයේ සහ අනාවරණයේ චාරිකාවක්” යන මැයෙන් සංවිධානය කළ වැඩසටහනක් 2025 නොවැම්බර් 19 වන දින කොළඹ දී පැවැත්විණ.

2. සංචාරක කර්මාන්තයේ අභිවෘද්ධිය උදෙසා දත්ත විශ්ලේෂණය අවබෝධ කර ගැනීම, සන්නාමකරණය අගය කිරීම සහ තාක්ෂණය අනාවරණය කරගැනීම යනාදිය වෙත අවධානය යොමු කරමින් දෙරට අතර සංචාරක සබඳතා ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් මෙම වැඩසටහන සංවිධානය කර තිබිණ. ශ්‍රී ලංකා රජයේ විදේශ කටයුතු සහ සංචාරක අමාත්‍ය විජිත හේරත් මැතිතුමා සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් සන්තෝෂ් ජා මැතිතුමා ද මෙම වැඩසටහන සඳහා සහභාගී වූහ.

3. විදේශ සංචාර මෙහෙයවන්නන් මෙන්ම රට තුළ සංචාර මෙහෙයවන්නන්, ආගන්තුක සත්කාර ක්ෂේත්‍රයේ ප්‍රමුඛයන් සහ මාධ්‍ය ක්ෂේත්‍රයේ නියෝජිතයන් ඇතුළු ශ්‍රී ලංකාවේ සංචාරක ක්ෂේත්‍රයේ පාර්ශවකරුවන් මෙම වැඩසටහන සඳහා සහභාගී වූහ. සන්නාමකරණය, සංචාරක කර්මාන්තයේ දත්ත විශ්ලේෂණය සහ තාක්ෂණය යනාදි අංශවල ප්‍රමුඛ පෙළේ ඉන්දීය ප්‍රවීණයන් රැසක් ද මෙම වැඩසටහන සඳහා සහභාගී වූහ.

4. ඉන්දීය රජයේ සංචාරක අමාත්‍යාංශයේ ඒකාබද්ධ ලේකම් එස්. හරික්‍රිෂෝර් මහතා විසින් සිදු කළ දේශනයක් සහ ඉදිරිපත් කිරීමක් ද වැඩසටහන සඳහා ඇතුළත් විය. ඉන්දියාවේ විවිධත්වයකින් යුත් සංචාරක කර්මාන්තය, විකසනය වෙමින් පවතින සන්නාමකරණ ක්‍රමෝපායන් සහ ශ්‍රී ලාංකික සංචාරකයන්ට සුබෝපභෝගී ලෙස මෙන්ම දැරිය හැකි මිලකට ඉන්දියාව පුරා සංචාරය කරමින් ලබා ගත හැකි නව අත්දැකීම් එතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

5. ශ්‍රී ලාංකික සංචාරකයන් සඳහා ඉන්දියාවේ මධ්‍ය ප්‍රදේශ් ප්‍රාන්තය වැදගත් සංචාරක ගමනාන්තතයක් වන බව මෙහිදී විශේෂයෙන් අවධාරණය කරන ලදී. මධ්‍ය ප්‍රදේශ් ප්‍රාන්ත සංචාරක සංවර්ධන සංස්ථාවේ කළමනාකරණ අධ්‍යක්ෂ ආචාර්ය ඉලයරාජා ටී. මහතා ප්‍රමුඛ මධ්‍ය ප්‍රදේශ් රජයේ ඉහළ මට්ටමේ දූත පිරිසක් ද මෙම වැඩසටහන සඳහා සහභාගී වූහ. මෙම වැඩසටහන හා සමගාමීව ප්‍රමුඛ පෙළේ ආගන්තුක සත්කාර සමාගම් සහ මහබෝධි සංගමය සමඟ විවිධ හමු ද සංවිධානය කර තිබිණ. රාමායණය හා සම්බන්ධ නිර්මාණයන්හි නිරත වන කලාකරුවන් සහ නිර්මාණකරුවන් සමඟ වටමේස සාකච්ඡාවක් ද පැවැත්විණ.

6. MakeMYTrip සහ Paytm ඇතුළු ඉන්දියාවේ සංචාරක සහ ඩිජිටල් ක්ෂේත්‍රයන් හි ප්‍රධාන පාර්ශ්වකරුවන් ද මෙම වැඩසටහන සඳහා සහභාගී වූ අතර ඔවුහු සංචාරකයන්ගේ හැසිරීම්, ඩිජිටල් ගෙවීම් සහ වෙනස්වන පාරිභෝගික ප්‍රවණතා යනාදිය පිළිබඳව වැදගත් කරුණු කාරණා රැසක් බෙදා ගත්හ. IIT Madras සමාගම ද ඉන්දියාවේ සුන්දර ගමනාන්ත එලෙසම විඳගැනීමේ අවස්ථාව ලබා දෙමින් සිය ඕග්මෙන්ටඩ් සහ වර්චුවල් රියැලිටි යෙදුම් (Augmented and Virtual Reality applications) ප්‍රදර්ශනය කරන ලදී.

7. මෙම වැඩසටහන තාක්ෂණය යොදාගනිමින්, සම්බන්ධතාවය ඉහළ නංවමින් සහ නව ගමනාන්ත ප්‍රවර්ධනය කරමින් සංචාරක ක්ෂේත්‍රයේ සහයෝගීතාවය ගැඹුරු කිරීමට ඉන්දියාව සහ ශ්‍රී ලංකාව දක්වන කැපවීම අවධාරණය කළේය.

*****

කොළඹ
*2025 නොවැම්බර් 20*